යම් කිසි ආබාධයක් සහිත පුද්ගලයෙකු සම්බන්ධ වන පුවතක් වාර්තා කිරීමේදී යොදාගත යුතු භාෂාව සම්බන්ධයෙන් බොහෝ කතිකාවත් තිබේ. මේ සම්බන්ධයෙන් අප ද බොහෝ විට පෙන්වා දී ඇත්තෙමු.

මේ වන විට ආබාධ සහිත වූවන් පිළිබඳව වාර්තා කිරීමේදී යෝග්‍ය භාෂාවක් ලෙසින් ලෝකයේ පිළිගැනෙන භාවිතයක් වන්නේ, අදාළ ආබාධය පුවතට අදාළ වේ නම්, පුද්ගල-ප්‍රථම භාෂාවක් (person-first language), නැතිනම් අනන්‍යතාවය-ප්‍රථම භාෂාවක් (identity first language) ඔස්සේ එම අය හැඳින්වීමයි.

ඒ අනුව, යම් අයෙකු "ආබාධිත පුද්ගලයෙකු (A disabled person)" ලෙසින් හඳුන්වා නොදී, ඒ වෙනුවට එම අය "ආබාධ සහිත පුද්ගලයෙකු (A person with a disability)" ලෙසින් හැඳින්වීම වඩාත් යෝග්‍ය නොවේ දැයි අපට විමසිය හැක. එනම් මෙහි අදහස වන්නේ ඒ පුද්ගලයා පළමුව පැමිණෙන බවත්, ඔහුගේ ආබාධ දෙවන තැන ගන්නා බවත් වේ.

මේ ඔස්සේ බලාපොරොත්තු වන්නේ ආබාධ සහිතව ජීවත් වන අයව කොන් කිරීම, නැතිනම් ඔවුන්ව වෙනස් කොට සැලකීම වැළැක්වීමයි.

මෙම පසුතලය යටතේ, ආබාධ සහිත තැනැත්තන් හට රියැදුරු බලපත්‍ර ලබාදීම සඳහා ගෙන ඇති තීරණය දිනමිණ සහ මව්බිම පුවත්පත් (දෙසැම්බර් 21, 2023) සිරස්තල වාර්තා කොට ඇති අන්දම සලකා බැලිය හැක.

* දිනමිණ - "ආබාධිතයන්ටත් රියැදුරු බලපත්"

* මව්බිම - "ආබාධ සහිත අයටත් රියැදුරු බලපත්‍ර"

මෙම පුවත් දෙකේම අන්තර්ගතයන් තුළ සඳහන් වන්නේ "ආබාධ සහිත තැනැත්තන්/පුද්ගලයන්" යන්නයි.

ඒ අනුව, පුද්ගල-ප්‍රථම හෝ අනන්‍යතාවය-ප්‍රථම භාෂාවකට අනුව ඉදිරිපත් වී ඇති, මෙම කරුණ සම්බන්ධ වඩාත්ම යෝග්‍ය වාර්තාකරණය ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක්ද?

